# 18

ඔබ අමතන මා ඔබෙ දෙව්දුත් වෙමි
සුභ වදන දෙසන්නට ඔබ කැඳවන්නෙමි
එන්න මගෙ පුතේ එන්න මගෙ දුවේ
දෙස් විදෙස් සිසාරා මගෙ පෙම කියන්න
කැමැත්ත පවසන්නේ

මිදුම කියන්නට වහල් දනන් හට
සිර ගත වූ අය මුදවා ගන්නට
අන්ධ දනන් හට පෙනීම දෙන්නට
සමිඳු වසර පවසන්නට දුගිනට

දහම් දූපතේ උපත ලැබූ ඔබ
දහම දෙසන්නට මගෙ කැඳවුම ලැබ
වෙලා මං මුලා දුව යන ඔබ මොබ
රැස් කර ගනු දන මගෙ සෙවනේ සුබ



මුහුදු හතක් ඈතින් ඈති රටකට
සයුරු වලල්ලෙන් එපිට දූපතට
යවනට දහම් දූතයෙකු විලසට
කැමති ද දුව පුත ඔබ කැප වන්නට

මා පිය හිමි මා යැවූ විලසින්නේ
යවනට දන වෙත ඔබ කැඳවන්නේ
වැය වන එළියක් වී බැබලෙමින්නේ
මා ගැන  ලෝකෙට කරුණු කියන්නේ